# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/164/2025 (PSC)**

එන්.ඒ.ඩී.එස්.නිස්සංකා
**අභියාචක**
**එදිරිව,**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

දිනය : 2026.02.12

**ඉදිරියේ දී** **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)**
**ජේ.ජේ.රත්නසිරි (සාමාජික)**
**එස්.නන්දසේකරන් (සාමාජික)**

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් නීතීඥ තරුෂි බුද්ධදාස මහත්මිය.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ටී.රේවතී මහත්මිය.

**-නියෝගය-**

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන් දුනිමු. අභියාචක විසින් 2025.07.04 වන දින ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඉහත කී අභියාචනා පෙත්සම සමඟ A1 වශයෙන් ඉදිරිපත් කර ඇති රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ක්‍රම සම්පාදන සහ සේවා අංශයේ අධ්‍යක්ෂක විසින් 2025.06.05 දිනැතිව දකුණු පළාත් ඉඩම් කොමසාරිස් වෙත යවා ඇති ලිපියේ සඳහන් තීරණයන් ඉවත් කර දෙන ලෙසයි.

එම ලිපිය මඟින් තීරණය වී ඇත්තේ අභියාචක විසින් 2025.05.29 වන දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියේ සඳහන්ව ඇති, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලැබ ඇති තීරණයයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකී තීරණය 2025.05.29 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා ඇති ලිපියේ සඳහන්ව ඇත. එහි සඳහන් වන්නේ අභියාචක විසින්, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමට අදාළව කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවයි. ඇය

විසින් මෙම ඉල්ලීම කරනු ලබන්නේ, ඉහත කී තනතුරට බඳවා ගැනීම සඳහා පවත්වන ලද තරඟ විභාගයෙන් ඇය සමත් වීම හේතුවෙනි.

එසේ පවත්වන ලද තරඟ විභාගයෙන් අනතුරුව, 2024.08.17 දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී තීරණය වී ඇත්තේ, ඉහත කී තනතුරට සුදුසුකම් ලැබීමට අවශ්‍ය වන, වර්ෂ 5ක සතුටුදායක සේවා කාලය අභියාචක විසින් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් අභියාචක එම තනතුරට සුදුසුකම් නොලබන බවයි. එම කාලපරිච්ඡේදය තුළ ඇයගේ වැටුප් වර්ධකයක් විලම්භනය කර ඇත. එම හේතුව සළකා බලා ඇයව ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ III ශ්‍රේණියට පත්කිරීම ප්‍රතික්ෂේප වී ඇත.

කෙසේ වෙතත් අභියාචක වෙනුවෙන් කරුණු දක්වා සිටින්නේ, අභියාචනා පෙත්සම සමඟ A11 වශයෙන් සළකුණු කර ඇති ලිපියට අනුව ඇයගේ වැටුප් වර්ධක විලම්භනය ඉවත් කිරීමට තීරණය කර ඇති බවයි. එම තීරණය අභියාචනා පෙත්සම සමඟ ඉදිරිපත් කර ඇති A10 දරන ලේඛනයේ සඳහන් වේ. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති 2024.12.06 දිනැති ලිපියේ එම ලේඛනය පිළිබඳව සඳහන් වේ. එම ලිපියට අනුව අභියාචක විසින් කරන ලද ඉල්ලීමක් සළකා බලා ඇය වෙත පමුණුවා ඇති වැටුප් වර්ධකය විලම්භනය කිරීම ඉවත් කිරීමට පළාත් ආණ්ඩුකාරතුමා තීරණය කර ඇත.

එම තීරණය ලබා දී ඇත්තේ 2024.12.04 දින වන අතර, අදාළ සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇත්තේ, 2024.08.17 දිනදීය. ඒ අනුව පෙනී යන්නේ, සම්මුඛ පරීක්ෂණයේදී මෙම නුසුදුසුකම ඉස්මතුවීමෙන් අනතුරුව, අභියාචක විසින් කරන ලද ඉල්ලීමක් සළකා බලා පළාත් ආණ්ඩුකාරවරයා විසින් එම තීරණය ලබා දී ඇති බවයි. එයින් හැඟී යන්නේ ආණ්ඩුකාරවරයාගේ අභිමතය ක්‍රියාකරමින් විනය නියෝගයකින් අනතුරුව ලබා දී ඇති තීරණය ඔහු විසින් අවලංගු කර ඇති බවයි.

කිසියම් විධිමත් ක්‍රියාකලාපයක් අනුගමනය කරමින් ලබා දී ඇති තීරණයක් අවලංගු කරන්නේ නම්, එම තීරණය ගනු ලැබූ තැනැත්තා විසින් එසේ අවලංගු කිරීමට හේතු දැක්විය යුතුය. එවැනි කරුණු දැක්වීමක් මෙම අවස්ථාවේදී දක්නට නැත. ඒ අනුව ආණ්ඩුකාරවරයාගේ තීරණය මත

ක්‍රියාකරමින්, අභියාචක ඉල්ලා ඇති සහන ලබාදීමට විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත.

ඉහත කරුණු සළකා බැලීමෙන් පසු විනිශ්චය අධිකාරයේ අදහස වන්නේ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ III ශ්‍රේණියට වූ බඳවා ගැනීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ දින වන විට, අභියාචක අදාළ තනතුර සඳහා අවශ්‍ය කරන සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කර නොමැති බවයි. එම කරුණ සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති මෙම අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/